

# මෙල්බර්න් උතුරු වික්ටෝරියාව
## 2019 සූර්ය උදානයෙන් ඔපවත් වෙයි.

ප්‍රේමසේන ලුණගම
විශ්‍රාමික විදුහල්පති, සාම විනිසුරු

ලෝකයේ නොයෙකුත් රටවල් කුමන ආකාරයක බලපෑම් ශ්‍රී ලංකාවට සිදු කලත් වසර ගණනාවක් තිස්සේ එවැනි බලපෑම් වලින් විනාශ කර දමන්නට නොහැකි වූ ප්‍රබලතම සංස්කෘතික අගයන් ලෙස සිංහල අලුත් අවුරුද්ද හැඳින්විය හැකිය. සිංහල බෞද්ධ හින්දු, ආගමික අනන්‍ය වූ මේ අපූරු සංස්කෘතික දායාදය පරපුරෙන් පරපුරට රැගෙන විත් මේ වන විට මව්බිමෙන් දුරස්තව රටවල වසර ගණනාවක පටන් ජීවත් වන සිංහල හා දමිල ජාතික ජනතාව ඒ ඒ රටවල සිට වුවද උත්කර්ශවත් අයුරෙන් සමරන අයුරු දැක ගැනීමට මට හැකිවු වා. වසර කිහිපයක් ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න් උතුරු වික්ටෝරියා ශ්‍රී ලංකා සුබසාධක (North Victoria Sri Lankan Welfare



Association) සංගමයේ නිලදරුවන් ඇතුළු සංගමයේ ක්‍රියාකාරී සාමාජිකයන් සැමගේ මූලිකත්වයෙන් සමාජ සේවා සංවිධානවල උපකාරයත්, සිංහල වෙළඳ ප්‍රජාවගේ නොමසුරු ආධාර හා සහභාගීත්වයත් සියලුම කලායතන නැටුම් කණ්ඩායම් වල සහභාගීත්වයත් සියලුම ගුවන් විදුලි සේවා මඟින් දින ගණනක සිට ප්‍රචාර කටයුතුවල නිරත වීමත් ලාංකික ජනතාව සූර්ය උදානය දැනුවත් කරමින් සහභාගීත්වයේ උනන්දුව ඇති කරමින් නොයෙක් ප්‍රචාරක කටයුතු ඉටු කිරීමෙන් ද, ස්වේච්ඡාවෙන් ඉදිරිපත්ව සහභාගීව උදව් උපකාර කල පිරිස් ගැනත් මා ගත කල 2013 වර්ෂය පුරා ඇසීමෙන් සාකච්ඡා තුළින් දැනගත් කරුණුය. එසේම



විශේෂයෙන් 2013 වසරේ එම අවස්ථාව ශ්‍රී ලාංකික සංචාරක පියෙකු ලෙස සහභාගීව, උත්සව සභාව ඇමතීමටත්, තරඟ ජයග්‍රාහි කයින්ට ත්‍යාග පිරිනැමීමටත් අවස්ථාව ලැබී මෙන් ලත් සියළු අත්දැකීම් තුලින් මා ලැබූ අවබෝධය අරමුණු කරගනිමින් 2019 වසරේ සිංහල හින්දු අළුත් අවුරුදු සූර්ය උදාන මංගල්‍යයේ සාර්ථකත්වයන් හා අගයන් නිල දරුවන් මඟින් ලත් තොරතුරු මත සන්නස පුවත්පතට ලිපියක් සැකසීමට සිතුවෙමි.

මව්බිමෙන් ඈත්වී බොහෝ කලක් ඕස්ට්‍රේලියාවේ ජීවත් වන පවුල් වල දරුවන්ට සිංහල අලුත් අවුරුද්ද පිළිබඳ පැහැදිලි චිත්‍රයක් නැත. ඔවුන් තම දෙමාපියන් කරන කියන දේ අනුව ක්‍රියා කරනු මිස ඒ පිළිබඳ කිසියම් හැඟීමක් හෝ විශේෂ පෙර දැනුමක් මොවුනට නැත. එහෙත් මාසික පුවත්පත් අතරින් පහන, සන්නස වැනි පුවත්පත් මඟින් අප්‍රියෙල් 14 දා ඉටුකල යුතු චාරිත්‍ර වේලාවන් පල කරයි. මෙය කියවා දැනගත් කරුණු අනුව සිංහල දරුවන්ට අවුරුදු චාරිත්‍ර පුරුදු පුහුණු කිරීමට ගන්නා වෑයම කොතරම් ද යන්න මම වටහා ගත්තෙමි. කෙසේ හෝ වැඩිහිටි පිරිස් තම දරුවන් හා සමඟ එකතුව මෙම දිනයේ ඒ ඒ චාරිත්‍ර ඉටුකරමින් අවබෝධයක් ලබා දෙමින් වැදගත්කම පැහැදිලි කර දී අනාගතයේ ඔවුනද එම චාරිත්‍ර විධි ඉටු කිරීමේ හැකියාව ලබා දීම ඉතා වැදගත්ය. තවද ලංකාවේ සෑම අප්‍රේල් 14 දා අවුරුදු චාරිත්‍ර ඉටුකිරීමේ හේතු බොහෝ ඇති බව අවබෝධ කල යුතුය. ඉන් ප්‍රධාන කරුණක් ලෙස සූර්යා ලංකාවට මුදුන්ව ගමන් කිරීම ස්වභාව ධර්මයාගේ බලපෑමක් බවත් මීන රාශියෙන් මේශ රාශියට සංක්‍රමණය වීමත් හේතුවන බව පැහැදිලි කර දීම වැදගත්ය. ඒ නිසාම මේදිනට සූර්‍ය මංගල්‍යය ව්‍යවහාර වේ. නැකත් චාරිත්‍ර වලින් හා කෙළි සෙල්ලම් වලින් යුක්තව ඉතා උත්සවත් ශ්‍රීයෙන් ඉටුකරනු ලබන ලෝකයේ රටවල් අතරින් එකම



රට ලංකාව බව දරුවන් දැනුවත් කිරීම දරුවන්ට අවබෝධ කර දීම ඉතා වැදගත් බවයි. මගේ හැඟීම, මේ සෑම කරුණුම හේතු සාධක කර ගනිමින් උතුරු වික්ටෝරියා සුභසාධක සංගමය ස්වේච්ඡා සංගම් හා සෙසු සංවිධාන, පුද්ගලයින් සම්බන්ධ කර ගනිමින් මද ශීත දේශගුණය නොතකා අප්‍රේල් මාසය උදාවීමටත් පෙර 2019 වසරේ මාර්තු 31 වෙනි ඉරිදා දවස පුරා නමවන වරටත් උත්සව ශ්‍රීයෙන් අවුරුදු සංස්කෘතික සූර්යඋදාන මංගල්‍යය පවත් වන්න යෙදුන බව දැනගැනීමට හැකිවිය. එය උතුරු වික්ටෝරියා සිංහල හින්දු ජනතාව සේම මටත් බලවත් සතුටකි.

එදාමෙන් මෙදිනද මද ශීත දේශගුණයක් පැවති බවත් එසේ වී නමුත් සියලු දෙනාම වාහනයෙන් අවුරුදු උත්සවය පැවති ක්‍රීඩා පිටියට උදය 9 පමණ වන විට ගිය බවත් දැනගන්නට ලැබුණි. ඒ වන විට ක්‍රීඩා පිටිය යාබදව රථ ගාල් භූමිය වාහන වලින් පිරී සංවිධායක මඩුල්ලේ සාමාජිකයින් කිහිප දෙනෙකු වාහන හැසිරවීමේ යෙදී සිටීම

එදාද මට දැකීමට ලැබුන මගේ ජීවිතයේ අමුතුම දර්ශනයකි. එයට හේතුව ලංකාවේ මෙන් පොලිස් නිලධාරීන්ගේ සහයක් නොලැබ තිබීමයි. ළමා තරුණ පිරිස් වැඩි ප්‍රමාණයක් වැඩිහිටියන් සමඟ ක්‍රීඩා පිටියේ ගැවසී සිටීමත් ඔවුන්ගේ උද්යෝගය කෙබඳු දැයි මට වටහා ගැනීමට මගේ බලවත් සතුට උපකාරී වූවා විය හැක. දර්ශනීය වේදිකාව ආසන්නයේ අඩකුඹුව ලක්මාතාවගේ ධජය හා ඕස්ට්‍රේලියා ධජය සංවිධායකයින් සකස් කර තිබුණි. නිවේදක මහතාගේත් මහත්මියගේත් සිංහල හි ඉංග්‍රීසි බසින් ප්‍රකාශිත කටහඬට සවන්



දීමත් සූර්ය උදානයේ ගාම්භීරත්වය ඔප් නැඟුනා සේ එදා දැනුනි. උදය 9 පමණ වන විට සංවිධායකයින් බලාපොරොත්තු පරිදි ශ්‍රී ලංකා කොන්සල් ජනරාල්වරයා හියුම් නගර සභාවේ සභාපති, පාර්ලිමේන්තු මන්ත්‍රීවරිය, හියුම් නගර සභාවේ නියෝජ්‍ය සභාපති ඇතුළු සම්භාවනීය පිරිස ක්‍රීඩා පිටියට පිවිසියේ ඕස්ට්‍රේලියානු ජාතිකයින් නියමිත වේලාවට වැඩ කිරීමේ පුරුද්ද අප සිංහල දු දරුවන්ට වැඩිහිටියන්ට ආදර්ශයක් ගෙන හැර පාන්නා සේය. ඇත්තටම ශ්‍රී ලාංකිකයෙකු ලෙස වෙලාවට වැඩ කිරීමේ අගය එදා මා වටහා ගත්තේ බලවත් සොම්නසිනි. මෙවරද එසේම එය ඉටුවී ඇති බව දැනගැනීමට ලැබීම ඉමහත් සතුටට කරුණකි.

නිවේදකයන්ගේ ආරාධනාවෙන් ආරාධිත විශේෂ අමුත්තන් සමඟින් සංගමයේ සභාපති, ලේකම් ඇතුළු නිලධාරී හා



සාමාජිකයන් දර්ශනීය වේදිකාව අසළට පිය නගත් දී දයා ද සිල්වා මහතාගේ සුමිහිරි වාදනය කාගේත් සතුට පළකලේ නොනැවතී ගුගුම්දුන් අත්පොළසන් නාදයෙනි. 2019 වර්ෂයේ ද එම ගුගුම් අත්පොලසන් නාදයත් ක්‍රීඩා පිටියේ සැමගේ සතුට ප්‍රකාශ වූ බව සංවිධායක මඩුල්ලෙන් දැනගන්නට ලැබුන සිද්ධියකි. සිංහල ධජය ශ්‍රී ලංකාවේ



කොන්සල් ජනරාල්වරයාත්, ඕස්ට්‍රේලියාවේ ධජය පාර්ලිමේන්තු මන්ත්‍රීවරියත් එසවීමේ ආරම්භයට සමගාමීව සිංහල දු දරු පිරිස ජාතික ගීයේ අභිමානය ඔප් නංවමින් දයා ද සිල්වා මහතාගේ වාදනයත් සමඟ ජාතික ගීය සිංහලෙන් හා ඕස්ට්‍රේලියා ජාතික ගීය ඉංග්‍රීසි බසින් ගායනා කරද්දී එදා මා තුළ ඇති වූ දේශාභිමාන හැඟීම දෑසෙන් කඩාහැලුණු තුටු කඳුලු වලින් මම විඳදරා ගතිමි. අනතුරුව දර්ශනීය මල් වැල් වලින් අලංකාරවත් කර තිබූ පොල්තෙල් පහන සිංහල බෞද්ධ සම්ප්‍රදාය ඉංග්‍රීසි ජාතිකයන් හට ගෙන හැර පෑවේ බෙර වාදනයෙ යන්, හක් පිඹීමෙන් තරුණ දු දරුවන්ගේ



ජයමංගල ගාථා හඬත් එම ගී රාවය ඔප් නැංවූ සංගීත මිහිරියාවයි. ඒ අතර විශේෂ ආරාධිතයින් හා එවකට සංගමයේ සභාපති ඇතුලු නිලධාරී මණ්ඩලයත් 2013 වසරේ ලංකාවෙන් සහභාගීව සිටි සංචාරක වැඩිහිටියෙකු ලෙස මට ද එම අවස්ථාවට ඇරයුම් කර පොල්තෙල් පහනේ සිළු දැල්වූයේ සූර්ය උදානයේ ආලෝකය උතුරු වික්ටෝරියාව පුරා පතුරුවමින්ය. සිංහල අපේ සංස්කෘතික චාරිත්‍ර සිරිත් නොඅඩුව දරුවන්ට ආදර්ශ ලෙස දැක බලා ගැනීමට සැලසීම ඉටුකිරීම ඇත්තෙන්ම සංගමයේ නිල මඩුල්ලට 2013 වසරේ මා තුති පිදුවේ හඬනඟා මනසින්ය. එම චාරිත්‍රය මෙවරද එලෙසින්ම ඉටුවී ඇතිබව දැනගැනීමට



ලැබීම මගේ බලවත් සතුටකි.

උත්සව සභාව ඇමතීමේ අවස්ථාව කථික







